# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1998/37 - 2016 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : පීඑල්ඩීඑස්/එල්එන්ඩී/04/ඒසීකිව්/71.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මා විසින් අංක 1305/15 හා 2003.09.09 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම පහත පරිදි සංශෝධනය කරමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර*:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩ පත්තුවේ සන්නස්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ මැනුම් අධිකාරි විසින් මැන සකස් කරන ලද අංක අ.ග.පි. 209, අතිරේක අංක 12 හි පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම් .

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: මනකුඹුරේගොඩ; විස්තරය : විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සන්නස්ගම, ලෙල්ලෝපිටිය පදිංචි රත්න මල්වත්ත හිමිකම් කියයි.; ප්‍රමාණය: හෙක්. 0.0051.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජනවාරි මස 16 වැනි දින පෙ.ව. 9.30 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජනවාරි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

සුගත් සිසිර කුමාර,
ප්‍රාදේශීය ලේකම් සහ
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
පැල්මඩුල්ල.

2016 දෙසැම්බර් මස 21 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

01 - 201